# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි සිව්වන වසර ප්‍රථම අර්ධ වර්ෂික පරීක්ෂණය - 2019 අගෝස්තු/සැප්තැම්බර්

ආර්ථික විද්‍යාව

**ECON 4175.03 – ගෝලීය ආර්ථික විවාද**

කාලය : පැය තුනකි (03)

---

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. (i) සීඝ්‍ර නාගරිකරණයේ ප්‍රධාන ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 06)

(ii) දියුණු වෙමින් පවතින රටවල ප්‍රධාන නගර ආශ්‍රිත නිවාස ප්‍රශ්නයට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) නාගරික නිවාස හිඟය විසඳීම සඳහා වඩාත් ඵලදායී විසඳුම් මොනවා ද ? (ලකුණු 04)

02. (i) ජෛව විවිධත්වය පරිසර පද්ධති වල ක්‍රියාකාරීත්වයට වැදගත් වන්නේ කෙසේ ද? (ලකුණු 04)

(ii) මානව වර්ගයාට ජෛව විවිධත්වය වැදගත් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ඔබගේ යෝජනා සඳහන් කරන්න. (ලකුණු 06)

03. (i) ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ග්‍රාමීය කාන්තාවන්ගේ කාර්යභාරය කුමක් ද? (ලකුණු 06)

(ii) ආහාර අනාරක්ෂිත බව නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ආහාර නාස්තිය වලක්වා ගතහැකි ක්‍රම මොනවා ද? (ලකුණු 06)

04. (i) ලෝක ජනගහනය වියපත්වීම නිසා ඇතිවන ආර්ථික බලපෑම විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) ශ්‍රම බලකායේ පහත වැටීමට ඉහළ යැපුම් අනුපාතය හේතුවන ආකාරය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 06)

05. (i) වර්තමාන ලෝකයේ පවතින දිළිඳුභාවයේ උපනතීන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) වර්ෂ 2030 වනවිට දිළිඳුකම තුරන්කළ හැකිවේදැයි ඔබ සිතන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 10)

06. (i) ලෝකයේ ඉදිරි ගමනට අධ්‍යාපනය දායක විය හැක්කේ කුමන ආකාරයට ද? (ලකුණු 10)

(ii) අධ්‍යාපනයේ ප්‍රතිලාභ අඩු කිරීමට බලපාන සාධක මොනවා ද? (ලකුණු 06)

07. කෙටි සටහන් ලියන්න.

(i) සංස්කෘතික ගෝලීයකරණය (ලකුණු 06)

(ii) කලාපීය ආර්ථික සහයෝගිතා අදියරයන් (Levels of Regional Economic Integration)

(ලකුණු 06)

(iii) උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුමේ (NAFTA) සහ දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංගමයේ (SAARC) වාසි අවාසි

(ලකුණු 04)

************